**ශීර්ෂය 19 - පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය**
**-----------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව, කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර, ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ). ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ). පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ). දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩ වර්ග 19 ක ඒකක 28 ක් එකතුව රු.10,220 කට වෙන්දේසි කිරීම මගින්ද, භාණ්ඩ වර්ග 14 ක ඒකක 42 ක් විනාශ කිරීම මගින්ද අපහරණය කර තිබුණු නමුත්, එම අපහරණයන් මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතිය යටතේ වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණයන් යටතේ වාර්තා කර නොතිබුණු අතර, මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීමක් හෝ සිදු කර නොතිබුණි. | වර්ෂය තුළ අපහරණයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | මෙම භාණ්ඩ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් නොවූ භාණ්ඩ වේ. ඒ හේතුවෙන් මෙම භාණ්ඩවල පොත් අගය හඳුනාගෙන නොමැති නිසා මෙලෙස ගැලපීම් කර නොතිබුණි. 2019 වර්ෂයේ සිට වත්කම් අපහරණයන් සිදු වන විටදී අපහරණ වටිනාකම් නිසිපරිදි ගැලපීම් කිරීමට කටයුතු කරනු ඇත. |

#### (ආ). ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i). | **ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 451 ප්‍රකාර චෙක්පත්, මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 451 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එම්.83 දරන ෆෝර්මය පරිදි ලැබෙන මුදල්, චෙක්පත්, මුදල් ඇණවුම් සටහන් කර ගැනීමට හැකිවන පරිදි ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුවේ. | චෙක්පත් ලැබීම් 03ක් අතපසුවීමකින් එම ලේඛනයේ සටහන් කිරීමට නොහැකි වී ඇත. |
| (ii). | **වාහන ලොග් පොත** | | |
| | මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 අකෘතිය ප්‍රකාරව සෑම වාහනයක් සම්බන්ධයෙන්ම වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (iii). | **වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාර වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

**(ඇ). විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i). | හිටපු විපක්ෂ නායකතුමා වෙත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු B-12 දරන රජයේ නිල නිවාසය සහ කාර්යාලය විසින් 2017 වර්ෂයේ සිට එම නිල නිවාසය වෙනුවෙන් | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 6 සහ 7 වගන්ති ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු ඉල්ලා සිටින | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | මිලදී ගෙන ලබා දී ඇති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ, නැවත විපක්ෂ නායකතුමාගේ කාර්යාලය වෙත හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත භාරදී ඇති බව පරීක්ෂා කිරීම අවශ්‍ය සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කළ යුතුවේ. | |
| (ii). | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, නිල වාහන හිමි නිලධරයන් වෙත අතිරේක ඉන්ධන අනුමත කිරීමේ ලේඛනයක් සහ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10.2 වගන්තිය ප්‍රකාරව, 1/20 දීමනා ගෙවීමේ ලේඛනයක් කාර්යාලය විසින් පවත්වා ගෙන යන බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | චක්‍රලේඛ උපදෙස් සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 6 සහ 7 වගන්ති ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු ඉල්ලා සිටින තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |

**(ඇ). ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත කරුණ සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඔබ විසින් දක්වා ඇති සහතික වීම මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව දැනටමත් නිවැරදිව සිදු කරනු ලබයි. එසේ හෙයින් ඔබ විසින් නිශ්චිත නොවන පරිදි සඳහන් කර ඇති මෙම ප්‍රකාශය සමග එකඟ විය නොහැකිය. |

**(ඉ). නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i). ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | |
| 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 සහ 6 වන වගන්ති | පනතේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.798,365 කට අදාල වවුචර් 15 ක නියැදියකට ගෙවීම් කිරීමේදී, අදාල මුද්දර ගාස්තු අයකරගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ වන විට නියමිත පරිදි මුද්දර ගාස්තු අය කිරීම් සිදු කෙරේ. |
| **(ii). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 104, 109 | 2017 වර්ෂය තුළ සිදුවී තිබුණු අලාභයන්වල එකතු වටිනාකම රු.492,559 ක් වූ, වාහන අනතුරු 06කට අදාලව මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව, පොදු 283, 284 සහ 285 ආකෘති මගින් පිළියෙළ කළ යුතු වාර්තාවල විගණකාධිපති පිටපත්, 2019 | නැතිවීම්/හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102 සිට මුදල් රෙගුලාසි 109 දක්වා වූ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, පොදු 283, 284 සහ 285 ආකෘති මගින් නියමිත කාලවකවානු තුළ පිළියෙළ කළ යුතු | පාඩු හා හානි සම්බන්ධයෙන් අදාල කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | සැප්තැම්බර් දක්වාම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, 2017 සැප්තැම්බර් 19 දින එක් රථයක අනතුරකින්වූ රු.358,721 ක පාඩුවෙන් රු.10,809 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | වාර්තාවල විගණකාධිපති පිටපත්, ඉදිරිපත් කළ යුතුවේ. | |
| **(iii). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>------------------ | | | |
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛ | මෙම කාර්යාලයේ සේවකයන් තම සේවා ස්ථානයට පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම මගින් 2018 මැයි 31 දිනට පෙර කාර්යාලය සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවි කිරීමට රු.150,000 කට ඇස්තමේන්තු කර තිබුණු නමුත්, වර්ෂය අවසානය දක්වාම එම ප්‍රසම්පාදන කාර්යය අවසන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම කාර්යාලය සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවිකිරීමට සැලසුම් කළත් එය සවිකිරීම සඳහා පාර්ලිමේන්තුවෙන් ලබාදුන් ස්ථානය සුදුසු ස්ථානයක් නොවූ බැවින් එහි සවි නොකරන ලදී. ඒ අනුව දැනට දෛනික පැමිණීම් හා පිටවීම් ලේඛන මගින් යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | 2007 අප්‍රේල් 20 දිනැති අංක 22/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | හිටපු විපක්ෂ නායකතුමා වෙත 2017 ජනවාරි 04 දින සිට B-12 දරන රජයේ බංගලා නිවාසය වෙන් කර දීමෙන් පසු, එතුමා වෙත 1997 දෙසැම්බර් 01 දින සිට වෙන් කර දී තිබුණු කොළඹ 05, 2D සමුළු නිවස නැවත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |
| | **(iv). රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| **(ඊ). අනුමත නොකළ ගනුදෙනු**<br>-------------------------<br>විධිමත් අනුමැතියකින් තොරව පහත සඳහන් ගනුදෙනු සිදු කර තිබුණි. | 2014 දෙසැම්බර් 30 දිනැති අංක 03/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(viii) වගන්තිය | චක්‍රලේඛ උපදෙස්වලින් පරිබාහිරව, රු.39,100 කට ජංගම දුරකථනයක් මිලදී ගෙන තිබුණු අතර, 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ජංගම දුරකථන සහ උපාංග මිලදී ගෙන රු.171,469 ක එකතු වියදමක් දරා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | රජයේ බොහෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්යයන්ට පරිබාහිර ක්‍රියාවලියක් මෙම කාර්යාලය මගින් සිදු කරයි. එහෙයින් මෙම රාජකාරී කටයුතුවලදී සන්නිවේදන පහසුකම් ජංගම දුරකථන මගින් බහුල වශයෙන් සිදු කරනු ලබයි. එහෙයින් මෙලෙස ජංගම දුරකථන මිලදී ගැනීමට සිදුවී ඇති බව සඳහන් කරමි. |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------------------ |
| විපක්ෂ නායකතුමාගේ අංක 30 කාර්යාලය පිරිසිදු කිරීමේ කාර්යය ඉටු කිරීම වෙනුවෙන් අදාල ආයතනය වෙත සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.702,400 ක ගෙවීම් කර තිබුණු නමුත්, සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන්හි අංක 30 කාර්යාලය වසා තැබෙන බැව් සහ එවැනි දිනවල පිරිසිදු කිරීමේ සේවකයන්ගේ පැමිණීම වාර්තා කළ නොහැකි බවට ස්ථාන භාර නිලධාරි විසින් දන්වා තිබියදී සහ සේවා ගිවිසුම් මගින් එවැනි දින සඳහා ගෙවීම් කෙරෙන ආකාරය පිළිබඳව එකඟතාවයකට පත්වී නොතිබියදී, සෙනසුරාදා සහ රජයේ නිවාඩු දිනවල පැමිණීමේ ලේඛනයේ අත්සන් කර තිබුණු පිරිසිදු කිරීමේ සේවකයන් වෙනුවෙන් ගෙවීම සහ අඩු පැය ගණනක් සේවය කර ඇති දිනයන් සඳහාද සම්පූර්ණ දිනක වැටුප ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සේවා අවශ්‍යතාවය මත පමණක් රජයේ නිවාඩු දිනවල ඔවුන්ගේ සේවය ලබා ගන්නා ලද අතර, ඒ අනුව එම පැමිණීම පදනම් කර ගෙන ගෙවීම් සිදු කර ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**බැරකම් හා බැඳීම්වලට එළඹීම**

**--------------------------------**

බැරකම් හා බැඳීම්වලට අදාළව අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | -------------------------------- |
| (අ). | මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව, සැපයුම් හා සේවා සම්බන්ධයෙන් වාර්ෂිකව පුනරාවර්තන වියදම්වලට අදාල එකතුව රු.252,100 ක බැරකම්, මූල්‍ය ප්‍රකාශනවල සටහන (iv) යටතේ වූ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව, සැපයුම් හා සේවා සම්බන්ධයෙන් වාර්ෂිකව පුනරාවර්තනය වන වියදම්, මූල්‍ය ප්‍රකාශනවල සටහන (iv) යටතේ වූ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතුවේ. | මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාර බැරකම් සඳහා මෙම කාර්යාලය බැරකම් ඇතිකර ගෙන නොමැත. එම නිසා මේ යටතේ අදාල වාර්තාවේ සටහන් කිරීමට අවශ්‍යතාවයක් නැත. |
| (ආ). | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල සටහන-(iii) යටතේ දක්වා තිබුණු බැඳීම හා බැරකම්, | අදාල බැරකම් CIGAS වැඩසටහනේ ඇතුළත් කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරයෙන් නිවැරදිව |

| | | |
|---|---|---|
| ප්‍රකාශනවල සටහන-(iii) යටතේ දක්වා තිබුණු බැඳීම් හා බැරකම්, භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමග එකඟ විය යුතු අතර, එලෙස වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක්, පෙර වර්ෂයේ වියදමක් ලෙස 2019 වර්ෂයේදී නිරවුල් නොකළ යුතුය. එහෙත් භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රකාශයෙහි වාර්තා වී නොතිබුණු මූල්‍ය ප්‍රකාශනවල සටහන-(iii) යටතේ දක්වා තිබුණු එකතුව රු.331,146 ක් වූ බැඳීම් සහ බැරකම්, 2019 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද බැඳීම් හා බැරකම් ප්‍රකාශය සමග එකඟ විය යුතු අතර, එලෙස වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක්, පෙර වර්ෂයේ වියදමක් ලෙස 2019 වර්ෂයේදී නිරවුල් නොකළ යුතුවේ. | උපදෙස් ලබාදීම සිදුවූයේ 2019.01.25 දින පැවති CIGAS සම්බන්ධ වැඩමුළුවේදී බව සඳහන් කරමි. මේ දින වන විට මෙම කාර්යාලයේ 2019 වර්ෂයට අදාල ගනුදෙනු CIGAS පරිගණක වැඩසටහනට ඇතුළත් කර ගෙන තිබූ බැවින්, මෙලෙස සිදුවී ඇති බව සඳහන් කරමි. කෙසේ වෙතත් මෙම බැඳීම් 2019 වර්ෂයේ CIGAS පරිගණක වැඩසටහනට ඇතුළත් කර ඇති බවද සඳහන් කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා පිළියෙල කළ යුතු ක්‍රියාකාරී සැලැස්මෙහි වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan) ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | මෙම කාර්යාලය විසින් නිවැරදිව අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති බව සඳහන් කරමි. |

### 3.2 ප්‍රසම්පාදනයන්

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ). | අංක 19-01-01-1201 දරන වැය විෂයය යටතේ ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.1,500,000 ක වියදම් ඇස්තමේන්තු පිළියෙල කර තිබුණු නමුත්, වර්ෂය අවසානයට සලසා ගෙන | ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇස්තමේන්තු පිළියෙල කර ප්‍රසම්පාදනයන් සිදු කළ යුතුවේ. | මෙලෙස ඉතිරිවීම් ඇතිවීම සිදු වූයේ වර්ෂය තුළ වියදම් මනා ලෙස කළමනාකරණය කිරීම මත බව සඳහන් කිරීමට කැමැත්තෙමු. |

| | | | | |
|---|---|---|---|---|
| | | තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,100,000 ක් විය. වර්ෂය තුළ ඉන් රු.997,762 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණු නමුත්, ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි. | | |

(ආ). සමාලෝචිත වර්ෂය තුළ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ බී - 12 නිල නිවස සඳහා රු.3,960,000 ක වියදමින් සූර්ය පැනල පද්ධතියක් සවි කිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශය** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| | ------------------ | ------------------ | ----------- | ----------------------------------- |
| (i). | 4.2.2, 4.2.3 සහ ප්‍රසම්පාදන අත්පොතේ 4.2.3 හි දැක්වෙන ආකෘති, 2.5.1(ආ), (ඇ), 2.6.1(අ)(i), 2.11.1, 2.11.1 (ආ) | ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙළ කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම ප්‍රසම්පාදනය සඳහා 2018.01.01 දින සිට 2018.06.30 දින දක්වා කාලය ප්‍රසම්පාදන සැලසුමේ දක්වා තිබුණි. එසේම මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු විසින් නියමිත පරිදි එම කමිටු රැස්වීම් පවත්වා ඇති බවද සඳහන් කරමි. |
| (ii). | 4.3.1 | 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි රු.3,200,000 පිරිවැය ඇස්තමේන්තුවක් දක්වා තිබුණු නමුත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවධාන ප්‍රකාරව ඊට ඇතුළත් වන සියලු වියදම් සහිත මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙළ කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවධාන ප්‍රකාරව, ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පෙර, අදාල වන සියලු වියදම් ඇතුළත් කර, මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතුවේ. | මේ සඳහා මූලික පිරිවැය හඳුනා ගන්නා ලද අතර, ඒ අනුව 2018 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට රු.3,200,000 ක මුදලක් ඇතුළත් කර ඇති බව සඳහන් කරමි. |
| (iii). | 5.3.1, 5.3.3, ප්‍රසම්පාදන අත්පොතේ 5.3.3 සහ සම්මත ලංසු ඉදිරිපත් කිරීමේ | සම්මත ලංසු ඉදිරිපත් කිරීමේ ලේඛන ආකෘති ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය, අත්පොත සහ සම්මත ලංසු ආකෘති ප්‍රකාරව | මෙම ප්‍රසම්පාදනයට අදාල සියළු තොරතුරු හා උපදෙස් අවශ්‍ය පරිදි සැපයුම්කරුවන් වෙත සඳහන් කර ඇත. Conditions of Contract (CC) හි කරුණු |

| | | | | |
|---|---|---|---|---|
| | ලේඛන ආකෘති | ආකෘති පිළියෙල කර නොතිබුණි. | ලංසු ලේඛන පිළියෙල කළ යුතුවේ. | ගැලපෙන ලෙස වෙනස් කිරීමට අතපසු වී ඇත. |
| (iv). | 5.3.13, 5.4.10(ඇ) සහ ප්‍රසම්පාදන අත්පොතේ 5.4.8 | ලංසු සුරක්ෂණයේ වටිනාකම තීරණය කළ ආකාරය හඳුනා ගැනීම සඳහා සාක්ෂි නොතිබුණු අතර, ලබා දිය යුතු කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම ලංසු කැඳවීමේ ලේඛනවල දක්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, ලංසු සුරක්ෂණයේ සහ කාර්යසාධන සුරක්ෂණයේ වටිනාකම වටිනාකම, ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකම මත ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තීරණය කර ලංසු කැඳවීමේ ලේඛනවල සඳහන් කළ යුතුවේ. | වර්තමාන ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඇස්තමේන්තු වටිනාකමින් ප්‍රතිශතය තීරණය කිරීම අධෛර්යමත් කර ඇති අතර, වර්තමානයේ සිදු කරනු ලබන ප්‍රසම්පාදනවලදී ස්ථාවර වටිනාකම් තීරණය කර ලංසු සුරක්ෂණය ලබා ගැනීම සිදු කරයි. ලංසු සුරක්ෂණ සහතිකයේ වටිනාකම පූර්වයේදී රුපියල් වටිනාකමින් නිශ්චය කළ නොහැකි අතර, එහිදී සාමාන්‍යයෙන් සිදුවනුයේ තෝරාගනු ලබන සැපයුම්කරු විසින් ඔවුන් විසින් යෝජනා කරනු ලබන මුදලින් 10% කාර්යසාධන ඇපකරයන් ඉදිරිපත් කළ යුතු බව සඳහන් කිරීම වනු ඇත. |
| (v). | - | පෞද්ගලික පරිහරණය මඟින් විදුලි පරිභෝජනය අඩුකර ගත හැකි විකල්ප පරීක්ෂාවක් හෝ සිදු කිරීමකින් තොරව, මෙම නිල නිවස අලුත්වැඩියා කිරීමේ රු.43,000,000 ක මුල් ඇස්තමේන්තුව මඟින් මෙම නිල නිවසට සූර්ය පැනල සවිකිරීමට ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තීරණය කර තිබුණි. | අධික වටිනාකමකින් යුතු ප්‍රසම්පාදනයක් පෞද්ගලික නිල නිවසක සිදු කිරීමට තීරණය කිරීමට පෙර, එහි පිරිවැයට සාපේක්ෂව එහි අවශ්‍යතාවය, ප්‍රයෝජනවත්භාවය සහ ඒ වෙනුවට අනුගමනය කළ හැකි විකල්පයන් තිබේද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුවේ. | සූර්ය බල ශක්තිය යටතේ විදුලිය සපයා ගැනීම රජයේ ප්‍රමුඛ කාර්යයක් වී ඇති බව දන්වා සිටිමි. මේ වන විට බොහෝ රාජ්‍ය ආයතන මෙලෙස සූර්යය බල ශක්තිය ලබා ගැනීමට ක්‍රියා කර ඇති බව සඳහන් කරමි. ඒ අනුව සැබෑ අවශ්‍යතාවයන් අනුව මෙම කාර්යය සිදු කර ඇති බව දන්වා සිටිමි. මෙම ආයෝජනය වර්ෂ 4 ක් වැනි සුළු කාලයකින් ආවරණය වන බවද සඳහන් කරමි. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා පදනම් කර ගනු ලබන කාලය, ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කිරීම වෙනුවට, පැමිණීමේ ලේඛනය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය තුළදී, ප.ව.6.30 න් පසුව පාර්ලිමේන්තු රැස්වීම් අවසන් වූ දින වෙනුවෙන් රු.617,250 ක ප්‍රවාහන දීමනා, රු.548,108 ක අතිකාල හා නිවාඩුදින වැටුප් සහ 2018 වර්ෂයේ ඉතිරි කරගත් නිවාඩු සඳහා ගෙවීම් රු.1,015,835 ක්ද වශයෙන් මුළු එකතුව රු.2,181,193 ක ගෙවීම් සිදු කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කාලය පදනම් කරගෙන ගෙවීම් සිදු කිරීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම පිටවීම සනාථ කළ යුතු බැවින්, ඒ අනුව ගෙවීම් කටයුතු කිරීමට අදාල නිලධාරීන් වගබලා ගත යුතුවේ. | මීට පෙර වර්ෂවලදීද මේ සඳහා පිළිතුරු ලබා දී ඇත. නියමිත පරිදි අදාල නිලධාරියාගේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගෙන නියමිත පරිදි ගෙවීම් කර ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 මණ්ඩලය අනුයුක්ත කාර්ය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිවෙලින් 78, 60 සහ 18 ක් විය.